18 වන පිටෙන්

නිරූපා කුලරත්න, ෂවිනි ලූකස්, ප්‍රසාත් කලුතන්ත්‍රී, කෙත්මි ජයවීර, නිරුක්ෂි කුලරත්න, දසුන් සුරංග , ක්‍රිස්ටල් කබ්රාල්, සිසිර බර්නාඩ් සහ ෂ්‍යාම් කාරියවසම් මේ ගායනා ඉදිරිපත් කළ ආකාරය පැසසුම් කටයුතු ය.

ගායක ගායිකාවන් තිස් දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතු ප්‍රසංගයක් නියමිත කාලයක් තුළ පවත්වා හමාර කිරීම ඉතා අපහසු කාර්යයකි. මියුරු සර සංවිධායක කණ්ඩායම ඒ වගකීම මැනැවින් ඉටුකිරීම විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

සංගීතය සැපයූ රිද්මික් කණ්ඩායමද





අමතක කළ නොහැකි සේවයක් කළ බව සටහන් කළ යුතු ය. දමිත් ජයතිලක බන්දු කන්දෙපොල තිසර හේවාපතිරණ සහ කණිෂ්ක ජයලත් එහි සාමාජිකනයෝ වූහ. සියලුම ප්‍රවේශ පත්‍ර විකිණී තිබූ මේ සාර්ථක ප්‍රසංගය මෙහෙයවීමේ වගකීම මට පැවරීම පිළිබඳව සංවිධායක මණ්ඩලයට ස්තුති කරනු කැමැත්තෙමි.

වසර කීපයක සිට මියුරු සර කණ්ඩායමේ ගමන දෙස සුහද සිතින් බලා සිටින අපට දිනෙන් දින එහි සාර්ථකත්වය ඉහළ යන ආකාරය පෙනෙයි. එය සතුටකි. මෙය බොහෝ දුර යා යුතු ගමනකි. ඒ ගමන නොනැවතී යන්නට මේ සමාජයේ සැමගේ ආශිර්වාදය ඔවුනට හිමිවෙයි.

